# රාහුල විද්‍යාලය - මාතර

## පළමු වාර පරීක්ෂණය - 2011

## නාට්‍ය හා රංග කලාව

**12 ශ්‍රේණිය** **කාලය : පැය 2 ½**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

**නිවැරදි පිළිතුර තෝරන්න.**

1) කලාවේ ප්‍රභේද වන්නේ

   i. නාට්‍ය කලාව , නර්තන කලාව, සංගීත කලාවයි

   ii. චිත්‍ර කලාව , මූර්ති කලාව , කැටයම් කලාවයි

   iii. ලලිත කලාව , ගැමි කලාව , ප්‍රසංග කලාවයි

   iv. නාට්‍ය කලාව , චිත්‍ර කලාව , ප්‍රසංග කලාවයි

   v. ගැමි කලාව , සංගීත කලාව , ප්‍රසාංගික කලාවයි.

2) ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවීව ඉදිරිපත් කරණු ලබන නාට්‍ය , නැටුම් , සංගීත වැනි කලාවන් අයත් වන්නේ

   i. ගැමි කලාවටයි   ii. ප්‍රසාංගික කලාවටයි.   iii. ලලිත කලාවටයි

   iv. නාට්‍ය කලාවවටයි   v. සෞන්දර්ය කලාවටයි

3) සංගීත ප්‍රාසාංගික කලාවක් ලෙස ඉදිරිපත් කිරීමේදී

   i. ගායකයා නර්තනය හා චලනය සමග ගායනය යොදාගත යුතුය.

   ii. ගායකයා ගායනය වාදනය ඇතුළු අනුශාංගික කලාවන් යොදා නොගත යුතුය.

   iii. ඒකල වශයෙන් පමණක් සංගීතය ඉදිරිපත් කළයුතුය.

   iv. යුගල වශයෙන් පමණක් සංගීතය ඉදිරිපත් කළයුතුය.

   v. සාමූහික වශයෙන් පමණක් සංගීතය ඉදිරිපත් කළයුතුය.

4) නාට්‍යයක පැවැත්ම රඳා පවතින්නේ

   i. ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර මතයි   ii. අධ්‍යක්ෂකගේ ක්‍රියාකලාපය මතයි.

   iii. අංග රචනා ශිල්පියා මතයි.   iv. අනුශාංගික කලාවන් යොදන ආකාරය අනුවයි.

   v. කතා වස්තුවේ ස්වරූපය අනුවයි.

5) මිනිසාගේ හැසිරීම් රටාව මනුෂ්‍ය ස්වාභාවය සහ එහි සංකීර්ණ බව ගුප්ත බව දුක ශෝකය ආදී විවිධ ආවේග හා මනෝභාවයන් වේදිකාවක් මත ඒ මොහොතේම මවා පෙන්වනු ලබන්නේ

   i. ප්‍රේක්ෂකයින් විසිනි   ii. අධ්‍යක්ෂක විසිනි.   iii. නළු නිළියන් විසිනි

   iv. වේෂ නිරූපණ ශිල්පියා විසිනි   v. අංග රචන ශිල්පියා විසිනි.

6) 16 වන ශත වර්ශයේ දී ඉතාලියේ හා ප්‍රංශයේ බිහිව 19 වන ශතවර්ෂය වන විට ලොව පුරා පැතිරුණු සම්භාව්‍ය නාට්‍ය විශේෂය වන්නේ

   i. බැලේ නාට්‍ය කලාවයි.   ii. ඔපෙරා නාට්‍ය කලාවයි

   iii. ගීත නාට්‍ය කලාවයි.   iv. මුද්‍රා නාට්‍ය කලාවයි

   v. ශෛලගත නාට්‍ය කලාවයි.

විභව VIBHAWA The Question Bank Rahula College, Matara

7) “ඉඟි නළුව” හෙවත් නෘත්‍ය නාට්‍ය නමින් හඳුන්වනු ලබන්නේ

i. බැලේ නාට්‍ය ii. ඔපෙරා නාට්‍ය iii. ගීත නාට්‍ය

iv. මුද්‍රා නාට්‍ය v. ශෛලීගත නාට්‍ය

8) “නලදමයන්ති සහ කරදිය” මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ

i. එස් . පනිභාරත මහතාය ii. ප්‍රේම කුමාර එපිටවෙල මහතාය

iii. චිත්‍රසේන මහතාය iv. මකුලොලුව මහතාය

v. ප්‍රේමසිරි කේමදාස මහතාය

9) පුරාණ කථා , දේව කථා, ජන කථා පදනම් කරගෙන නිර්මාණය කරන ලද නාට්‍ය කලාව

i. බැලේ නාට්‍ය ii. ඔපෙරා නාට්‍ය iii. ගීත නාට්‍ය

iv. මුද්‍රා නාට්‍ය v. ශෛලීගත නාට්‍ය

10) ගායනය වාදනය ප්‍රමුඛ සංගීතයෙන් නාට්‍ය මෙහෙය වන්නේ

i. බැලේ නාට්‍ය වලදීය ii. ඔපෙරා නාට්‍ය වලදීය iii. ගීත නාට්‍ය වලදීය

iv. මුද්‍රා නාට්‍ය වලදීය v. ශෛලීගත නාට්‍ය වලදීය

11) ශ්‍රී ලංකාවට ආවේණික ශෛලයකින් යුතු ඔපෙරාවක් වන්නේ

i. රෝමියෝ ජුලියට් ii. මානස විල iii. ඇලඩින්

iv. සත්‍ය ග්‍රහ v. ඊඩිපස්

12) අභිනයෙන් කියවෙන කිසිදු අර්ථයක් නැති ශුද්ධ ගැටුම හෙවත් රිද්මයානු කූලව කෙරෙන ගාත්‍රා වික්ෂේපය ලෙස හඳුන්වන්නේ

i. නෘත්ත යන කොටසයි ii. නෘත්‍යය යන කොටසයි

iii. නාට්‍යය යන කොටසයි iv. නර්තනයයි.

v. භාවයයි.

13) “ නර්තකිය මුවින් ගීත ගයන්නීය ; හස්තයෙන් අර්ථය ප්‍රකට කරන්නීය ; දෑසින් භාව්‍ය දක්වන්නීය ; දෙපයින් තාල තබන්නීය ” යනුවෙන් සඳහන් වන්නේ

i. සිංහල ගැමි නාටක යේය. ii. අභිනය දර්පණයෙහිය

iii. බටහිර නාට්‍ය කලාවේය iv. නාට්‍ය ශාස්ත්‍රයෙහිය

v. කාව්‍ය ශාස්ත්‍රයෙහිය

14) “ නාට්‍යය යනු ලෝකයේ සුඛ - දුක්ඛ යන දෙකෙන්ම යුක්ත වූ යම් ස්වභාවයක් පවතීද එය අංග ආදී අභිනයෙන් ප්‍රකාශ කිරීමයි.” යනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ

i. ඇරිස්ටෝටල් විසිනි ii. ඇලඩයිස් නිකොල් විසිනි

iii. භරතමුනි විසිනි iv. ධනංජය විසිනි

v. බර්නාඩ් ෂෝ විසිනි

15) චරිතයකට ආරෝපනය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත්වීමේ නළු කාර්යය හඳුන්වන්නේ

i. අභිනය යනුවෙනි ii. අනුකරණය යනුවෙනි

iii. අනුරූපණය යනුවෙනි iv. රූපණය යනුවෙනි

v. සමාරෝපය යනුවෙනි

VIBHAWA විභව The Question Bank Rahula College, Matara

16) රූපණය පිළිබඳ පෙරදිග සංකල්පයට අනුව සංස්කෘත නාට්‍යයෙහි දක්නට ලැබෙන්නේ

i. ප්‍රේක්ෂකයාට රසය ලබා දීම මුඛ්‍යාර්ථය කරගත් රූපණ ක්‍රමයකි.

ii. පාත්‍ර වර්ගයාට රසය ලබා දීම මුඛ්‍යාර්ථය කරගත් රූපණ ක්‍රමයකි.

iii. අධ්‍යක්ෂක වරයාට රසය ලබා දීම අරමුණු කරගත් රූපණ ක්‍රමයකි.

iv. වේෂ නිරූපණ ශිල්පියාට රසය ලබා දීම අරමුණු කරගත් රූපණ ක්‍රමයකි.

v. ප්‍රේක්ෂකයාට සහ අධ්‍යක්ෂක වරයාට රසය ලබා දීම අරමුණු කරගත් රූපණ ක්‍රමයකි.

17) “ මහබඹු විසින් ඉතිහාසය හා වේදය ගැබ්කොට දෙවියන්ගේ හා මනුෂ්‍යයින්ගේ රස වින්දනය උදෙසා කිසියම් නාට්‍යවේදයක් වේද ” එය

i. ලෝකධර්මි නාට්‍යය වේ.
ii. නාට්‍යධර්මී නාට්‍යය වේ.
iii. ගීත නාට්‍යය වේ.
iv. ශෛලගත නාට්‍යය වේ.
v. මුද්‍රා නාට්‍යය වේ.

18) ක්ෂණික නිරූපණ ප්‍රධාන වශයෙන් කොටස්

i. 2 කි
ii. 3 කි
iii. 4 කි
iv. 5 කි
v. 6 කි

19) සමූහ ක්ෂණික නිරූපණයක් සඳහා ගොඩ නැගීම සඳහා යොදා ගන්නා කාල සීමාව

i. විනාඩි **5** කි.
ii. විනාඩි **3** කි.
iii. විනාඩි **10** කි.
iv. විනාඩි **8** කි.
v. විනාඩි **15** කි.

20) නාට්‍ය කලාව තුළ ගැබ්විය යුතු අනිවාර්ය අංගයකි.

i. ගැටුම් අවස්ථාව
ii. නාට්‍ය පෙළ
iii. සජීවී බව
iv. ශෛලිය
v. අනුකරණය

විභව VIBHAWA The Question Bank Rahula College Matara

## II කොටස

**එක කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.**

### A කොටස

(1) i. ප්‍රාසාංගික කලාව යන්න හඳුන්වන්න

ii. සෙසු නාට්‍ය කලාවන්ගෙන් ප්‍රාසාංගික කලාව වෙනස් වන්නේ කෙසේද?

iii. නාට්‍ය කලාව ප්‍රාසාංගික කලාවක් ලෙස සුවිශේෂ වන්නේ කෙසේද?

(2) i. නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත විවිධ සම්ප්‍රදායන්ට අයත් යාතු කර්මයක් තෝරාගෙන එහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න.

ii. යාතු කර්මයක් තෝරාගෙන එහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න.

iii. බෞද්ධ පූජාකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය අවස්ථා නම් කරන්න.

(3) i. උඩරට සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයක් නම් කරන්න.

ii. එහි පුරාවෘත කතාව සැකවින් දක්වන්න.

iii. එහි නාට්‍යමය අවස්ථාවක් පිළිබඳව විස්තර කරන්න.

විභව
VIBHAWA
The Question Bank
Rahula College, Matara

### B කොටස

(4) i. දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

ii. ආදි මිනිසා විවිධ අභිචාර ක්‍රියා පැවැත්වීම තුළින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අවශ්‍යතා කිපයක් නම් කරන්න.

iii. සියපුරුෂයන් යුද්ධය සඳහා ගිය කළ බිරින්දෑ වරු කරන ලද ක්‍රියාකාරකම් මොනවාද? ඔවුන් ඒ තුළින් බලාපොරොත්තු වූයේ කුමක්ද?

(5) i. ලංකා විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි නාටය සංගමය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින්ද?

ii. විශ්ව විද්‍යාල සිංහල සමිතිය පිහිටු වීමෙන් පසු සිදු වූ සමාජ සේවය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

iii. මහාචාර්ය එදිරිවීර සරත් චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද **පබාවතී** නාට්‍යය විචාරකයන්ගේ දෝෂ දර්ශනයට ලක්වීමට හේතු පැහැදිලි කරන්න.

(6) i. නාඩගම් ප්‍රභවය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

ii. මුල්ම සිංහල නාඩගම කුමක්ද? එය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

iii. නාඩගම් ව්‍යාප්තව තිබූ ප්‍රදේශ නම් කරන්න. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ පැරණිම නාඩගම නම් කරන්න.